සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

# හින්දු ශිෂ්ටාචාරය I
# இந்து நாகரிகம் I
# Hindu Civilization I

46 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ✳ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එහි අංකය** උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක්** (X) **යොදා දක්වන්න**.

**1.** වේද, ශ්‍රවනය කර එය මුඛයෙන් ගයනු ලැබීම හේතුවෙන් කියනු ලබන නාමය,
(1) අපෞරුෂේයම් වේ. (2) එලුදාමරෛ වේ. (3) සුයම්බු වේ.
(4) සුරුදි වේ. (5) පරවිද්‍යා වේ.

**2.** ඍග් වේදයේ සඳහන් මැවීමට අදාළ දෙවියා ලෙස ප්‍රශංසා ලබන්නේ,
(1) උරුත්තිරන් ය. (2) ප්‍රජාපති ය. (3) පර්ජන්‍යයන් ය. (4) පූෂන් ය. (5) සෝමන් ය.

**3.** 'ඔලුංගින් කාවලන්' යනුවෙන් ප්‍රශංසා ලබන දෙවියන් වන්නේ,
(1) වරුණන් ය. (2) අග්නි ය. (3) ඉන්ද්‍රන් ය. (4) යමන් ය. (5) මිත්තිරන් ය.

**4.** "තල ඇටවල තෙල් අඩංගු වී ඇති සේ බ්‍රහ්ම දර්ශනය වැසී තිබේ" යනුවෙන් සඳහන් කරන උපනිෂද් වන්නේ,
(1) බ්‍රහතාරණ්‍ය උපනිෂද් ය. (2) සාන්තොක්‍ය උපනිෂද් ය. (3) කටෝපනිෂද් ය.
(4) සුවේදාස්වතර උපනිෂද් ය. (5) කේන උපනිෂද් ය.

**5.** වෛෂ්ණව ආගමම් අනුව පිළිම හැඩ යන්නට සඳහන් වන නම වන්නේ,
(1) පරම් ය. (2) විභවම් ය. (3) වියූගම් ය.
(4) අන්තර්යාමිත්තුවම් ය. (5) අර්ච්චා ය.

**6.** දෙවියන්ට විවිධ නාම කියමින් වන්දනා කරන ක්‍රමය මුල්වරට සඳහන් කරන වේදය වන්නේ,
(1) ඍග් වේදය. (2) යජුර් වේදය. (3) බ්‍රහ්ම වේදය. (4) අතර්ව වේදය. (5) සාම වේදය.

**7.** දරිද්‍රතාවයෙන් දුක් විඳිමින් සිටි වයෝවෘද්ධ කාන්තාවට කනගදාරා ස්තෝත්‍රය ගයමින් රත්රන් නෙල්ලි ගෙඩිය ලබා දෙනු ලැබුවේ,
(1) රාමානුජර් විසිනි. (2) නිම්පාර්ක්කර් විසිනි.
(3) ආදිශංකරර් විසිනි. (4) මත්තුවර් විසිනි.
(5) ඥානදේවර් විසිනි.

**8.** කුඩුමියාමලෛ සෙල්ලිපියේ සඳහන් ශිවතෝත්‍රය මගින් තම ඇඩි ශිව භක්තිය ප්‍රකාශ කළ පල්ලව රජු වන්නේ,
(1) දෙවන නරසිම්ම වර්මන් ය. (2) මාමල්ලන් ය.
(3) පරමේසුවර වර්මන් ය. (4) මහේන්ද්‍ර වර්මන් ය.
(5) නන්දි වර්මන් ය.

**9.** "දෙවියන් පමණී සත්‍යය; සියලු දෙනාම පැමිණෙත්වා" යනුවෙන් ආගමික එකඟතාවය ඉදිරිපත් කළ නූතන යුගයේ හින්දු ආගමික සංශෝධකයා වන්නේ,
(1) රාජරාම් මෝහන්රායි ය. (2) දයානන්ද සරස්වති ය.
(3) සුවාමි විවේකානන්දර් ය. (4) ශ්‍රී රාමක්‍රිෂ්ණර් ය.
(5) අන්නි පෙසන්ට් මව්තුමිය ය.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

**10.** ශෛව සිද්ධාන්ත සාශ්ත්‍ර ග්‍රන්ථවල තිබෙන අදහස් එක්රැස් කර සහ පැහැදිලි කර අටුවා ග්‍රන්ථයක් රචනා කළ ශ්‍රී ලාංකේය ශෛව ආගමික විද්වතුන්ගෙන් ප්‍රමුඛ ස්ථානය ලබන්නේ,
(1) අරුණාසල තේසිගර් ය. (2) කාසිවාසි සෙන්දිනාදෛයර් ය.
(3) පණ්ඩිත ඒලාලෛ මු. කන්දෛයා ය. (4) පණ්ඩිතමනි සී. කණපතිපිල්ලෛ ය.
(5) ශිවපාදසුන්දරනාර් ය.

**11.** බ්‍රහ්ම සූත්‍රයට විසිට්ටාත්වෛද දෘෂ්ටියෙන් ලියන ලද විවරණ ග්‍රන්ථය වන්නේ,
(1) වේදාන්ත සාරම් වේ. (2) වේදාන්ත තීබම් වේ. (3) ශ්‍රී භාෂ්‍යම් වේ.
(4) වේදාන්ත සංකිරහම් වේ. (5) නිත්‍ය කිරන්දම් වේ.

**12.** 'මගවාන්' යනුවෙන් වර්ණනා කරනු ලබන දෙවියන්
(1) රුද්‍රන් ය. (2) ඉන්ද්‍රන් ය. (3) බෘහස්පති ය. (4) වරුණන් ය. (5) අග්නි ය.

**13.** තිරුකේදීශ්වරම් ශිව දේවාලයේ වැඩ සිටින දෙවියන් පිළිබඳ තේවාරම් ගැයුවේ,
(1) කාරෛක්කාල් අම්මෛයාර් ය. (2) අප්පර් ය. (3) සුන්දරර් ය.
(4) මනිවාසගර් ය. (5) සේක්කිලාර් ය.

**14.** 'කේවලාත්තුවෛදම්' යන දාර්ශනික සංකල්පය බිහි කරන ලද දාර්ශනිකයා වන්නේ,
(1) මත්තුවර් ය. (2) රාමානුජර් ය.
(3) සුවාමි විවේකානන්දර් ය. (4) ආදිශංකරර් ය.
(5) නිම්බාර්ක්කර් ය.

**15.** මංගලාසනම් ලැබූ දිව්‍ය දේශ බිහිවීමට හේතු වූයේ,
(1) ආල්වාර්ලා ය. (2) ආසාරියර්ලා ය. (3) සංගමර්ලා ය.
(4) නායන්මාර්ලා ය. (5) බෞද්ධ බැතිමතුන් ය.

**16.** කන්නඩයේ සමාජ සමානාත්මතාවය ස්ථාපිත කිරීම සඳහා හරිදාසර්ලා බිහිකිරීම පිළිබඳ විශිෂ්ටත්වයට පත්වූයේ,
(1) මත්තුවර් ය. (2) ශංකරර් ය. (3) ගෞඩපාදර් ය.
(4) ශ්‍රී රාමක්‍රිෂ්ණර් ය. (5) පාදරායණර් ය.

**17.** පහත සඳහන් අයගෙන් ශ්‍රී රංගම් දේවාලයේ මඩාදිපතියෙකු ලෙස සිටියේ,
(1) පද්මපාදර් ය. (2) ආලවන්දාර් ය. (3) තෝඩගර් ය.
(4) ආනන්ද තීර්ත්තර් ය. (5) ගෞඩපාදර් ය.

**18.** ශෛව සිද්ධාන්ත සම්ප්‍රදායේ "විඩිවාමලවුම් විලක්කනෛය මායෛය වඩිවාදි කන්මත්තු වන්දු" යනුවෙන් සඳහන් කරන ග්‍රන්ථය,
(1) ශිවඥානසිත්තියාර් ය. (2) කොඩික්කවි ය.
(3) තිරුවරුට්පයන් ය. (4) විනාවෙන්බා ය.
(5) නෙන්ජුවිඩු තුදු ය.

**19.** "මෙම ශරීරය අපිට ලැබුණේ, අපි දෙවියන් වන්දනා කරමින් විමුක්තිය යන සතුට ලැබීම පිණිසය" යනුවෙන් සඳහන් කළ ශ්‍රී ලාංකේය ශෛව ආගමික විද්වතා,
(1) කාසිවාසි සෙන්දිනාදෛයර් ය. (2) නල්ලෛ නගර් නාවලර් ය.
(3) අරුණාසල තේසිගර් ය. (4) සුවාමි විපුලානන්දර් ය.
(5) සුවාමි ඥානප්‍රකාසර් ය.

**20.** නායන්මාර්ලා හැටතුන්දෙනාගේ ජීවන ඉතිහාස මගින් වල්විනෛ සහ මෙල්විනෛවල වැදගත්කම පැහැදිලි කරනුයේ,
(1) තිරුක්කලිට්‍රුප් පඩියාර් ය. (2) ශිවඥානසිත්තියාර් ය.
(3) ශිවඥානපෝදම් ය. (4) සංකට්ප නිරාකරනම් ය.
(5) තිරුවුන්දියාර් ය.

**21.** ශෛව සිද්ධාන්තම් පවසන පරිදි 'සදසත්තු' යන පදයෙන් අදහස් කරනුයේ,
(1) පදි ය. (2) ආත්මය ය. (3) ආණවම් ය. (4) කන්මම් ය. (5) මායෛ ය.

Department of Examinations - Sri Lanka

22. දේවාලවල කදාප්‍රසංගම් සිදුකිරීමේ වැදගත් අරමුණ වන්නේ,
(1) භක්තිකයන් කාලය ගත කිරීමට ය.
(2) ආගමික අදහස් සාමාන්‍ය ජනතාවට පැහැදිලි කිරීමට ය.
(3) ජනතාව භේදයක් නොමැතිව එක්රැස් කිරීමට ය.
(4) කදාප්‍රසංගම් කරන අය තම දක්ෂතාවය ප්‍රකාශ කිරීමට ය.
(5) යොවුන් පරපුර අතර දේවාල වන්දනාව පිළිබඳ බැඳීමක් ඇති කිරීමට ය.

23. ශෛව සිද්ධාන්තම්හි ඇති අදහස් බහුල වශයෙන් ඇතුළත්ව තිබෙන ශිවාගමම් අතුරෙන් දෙකක් අඩංගු කාණ්ඩය කුමක් ද?
(1) කාමිගම් සහ කාරණම්
(2) මගුඩම් සහ සින්දියම්
(3) කිරණාගමම් සහ රෞරවාගමම්
(4) දීප්තම් සහ සූක්කුමම්
(5) විමලම් සහ බිම්බම්

24. හින්දු පිළිම කලා සම්ප්‍රදායේ වාත්තු පිළිම විශේෂයෙන් බිහි වූ යුගය ලෙස ප්‍රශංසා ලබන්නේ,
(1) පාණ්ඩ්‍ය යුගය වේ.
(2) චෝල යුගය වේ.
(3) සංග යුගය වේ.
(4) පල්ලව යුගය වේ.
(5) විජයනගර යුගය වේ.

25. ආධ්‍යාත්මික විමුක්තිය සඳහා භගවත්ගීතාව පෙන්වා දෙන අනුක්‍රමය වන්නේ,
(1) ගිහි ධර්මය ය.
(2) බ්‍රහ්මචර්ය ජීවිතය ය.
(3) සරණාකදි ය.
(4) ඇඳුරු වන්දනාව ය.
(5) මලවුන් වන්දනාව ය.

26. තිරුක්කෝණේෂ්වරම් ශිව දේවාලයේ තීර්තම් හි නම කුමක් ද?
(1) පාවනාසම්
(2) පාලාවි
(3) කෝයිට් තිරුක්කේනි
(4) මායවන් ගඟ
(5) මැණික් ගඟ

27. අග්නිදිග ආසියාවේ තෛපූසම් දිනය විශේෂයෙන් සමරනු ලබන දේවාලය වන්නේ,
(1) කෝර්ට්ටුමලෛ කන්දසාමි දේවාලය ය.
(2) පත්තුමලෛ මුරුගන් දේවාලය ය.
(3) ශ්‍රී සුන්දරේෂ්වරර් දේවාලය ය.
(4) පත්තිරේෂ්වරර් දේවාලය ය.
(5) පිරම්බනාර් දේවාලය ය.

28. කාංචියේ කෛලාසනාදර් දේවාලය හා විශේෂයෙන් සම්බන්ධවන නාමය වන්නේ,
(1) ජලසයනම් ය.
(2) තෙන්තිසෛමේරු ය.
(3) පෙරිය තිරුක් කට්ටලි ය.
(4) විණ්ණගරම් ය.
(5) බ්‍රහදීෂ්වරම් ය.

29. තමිල් නාඩුවේ ශෛව ආගමික සම්ප්‍රදායේ දෙවියන්ව "පණ්ණුම් පදමේලුම් පලවෝසෛත් තමිලවෛයුම්" යනුවෙන් ගයමින් සංගීතය ප්‍රශංසා කරනුයේ,
(1) සම්බන්තර් ය.
(2) අප්පර් ය.
(3) කාරෛක්කාල් අම්මෛයාර් ය.
(4) සුන්දරර් ය.
(5) මාණික්ක වාසගර් ය.

30. ඉතිකාසංගල් අවසන් අදියරයට පත් වූ යුගය වන්නේ,
(1) කුෂාණර් යුගයයි.
(2) මෞරිය යුගයයි.
(3) ගුප්ත යුගයයි.
(4) චෝල යුගයයි.
(5) සාලුක්කියර් යුගයයි.

31. 'සංස්කෘත භාෂාවෙන් රාමායණය රචනා කළ පැරණිතම කවියා' යන ආඩම්බරයට පාත්‍ර වන්නේ,
(1) වියාසර් ය. (2) වාල්මිකී ය. (3) නාරදර් ය. (4) ගෞඩපාදර් ය. (5) කාලිදාස ය.

32. "නැගිටින්න, අවදිවන්න" (එලුමින්, විලිමින්) යනුවෙන් යෞවනයින්ට සමාජ සේවා සඳහා ආරාධනා කරන ලද්දේ,
(1) ශ්‍රීලශ්‍රී ආරුමුගනාවලර් විසිනි.
(2) දයානන්ද සරස්වති විසිනි.
(3) රමණර් විසිනි.
(4) රාජාරාම් මෝහන්රායි විසිනි.
(5) සුවාමි විවේකානන්දර් විසිනි.

Department of Examinations - Sri Lanka

**33.** ශිවාගමම්හි අන්තර්ගත වී තිබෙන ක්‍රියාපාදම් හි 'කර්ෂණම්' යන කොටසින් අර්ථවත් වන්නේ,
(1) නිත්‍ය පූජාව වේ.
(2) දේවාල නිර්මාණ ක්‍රම වේ.
(3) දේවාල නිර්මාණය කිරීමට අදාළ ස්ථානයේ බිම සකස් කිරීම වේ.
(4) දේවාලයට වන්දනා කරන ක්‍රම වේ.
(5) දේවාලයේ පවතින මහෝත්සවය වේ.

**34.** තමිල්නාඩුවේ දේවාලවලින් 'ආකාෂය' විශේෂාංගය ලෙස ප්‍රශංසා කර වන්දනාමාන කරනු ලබන දේවාලය වන්නේ,
(1) තිරුක්කාලත්ති ය. (2) සිදම්බරම් ය.
(3) තිරුක්කඩවූර් ය. (4) තිරුවණ්ණාමලෛ ය.
(5) තිරුවානෛක්කා ය.

**35.** "උසස්ම ධර්මය වන්නේ අහිංසාවයි" යනුවෙන් ප්‍රශංසා කරන ග්‍රන්ථය වන්නේ,
(1) අදර්ව වේදය ය. (2) බ්‍රහ්මසූත්‍රය ය.
(3) මහාභාරතය ය. (4) සුක්‍රනීතිය ය.
(5) කටෝපනිෂද් ය.

**36.** ශෛව සිද්ධාන්ත ශාස්ත්‍රවල 'සිත්තාන්ද අට්ටගම්' යනුවෙන් ප්‍රශංසා කරනු ලබන ග්‍රන්ථ අට රචනා කිරීම පිළිබඳ ගෞරවය හිමිවන්නේ,
(1) මෙයිකණ්ඩාර්ට ය. (2) අරුණන්ති සිවාචාරියාර්ට ය.
(3) මනවාසගංකඩන්ද දේවර්ට ය. (4) උයියවන්ද දේවර්ට ය.
(5) උමාපති සිවාචාරියාර්ට ය.

**37.** ශිවාගමම් සඳහන් කරනු ලබන පිළිවෙත්වලට මග පෙන්වනු ලබන්නේ,
(1) ප්‍රාමණංගල් විසිනි. (2) වේදාංගංගල් විසිනි.
(3) පත්තදිහල් විසිනි. (4) පුරාණංගල් විසිනි.
(5) තිරුමුරෛහල් විසිනි.

**38.** ශෛව ආගමික සම්ප්‍රදායේ සරියෛ සේවාවන් කළ නායනාර්තුමා වන්නේ,
(1) නාවුක්කරසර් ය. (2) ඉලෛයාන්කුඩිමාර නායනාර් ය.
(3) කණ්ණප්පර් ය. (4) අප්පූදියඩිහල් ය.
(5) සම්බන්තර් ය.

**39.** "තේවාරම් වේදසාරම්" යනුවෙන් සඳහන් කළ ශ්‍රී ලාංකේය ශෛව සිද්ධාන්ත විද්වතා වන්නේ,
(1) ආරුමුගනාවලර් ය. (2) කාසිවාසි සෙන්දිනාදෛයර් ය.
(3) සුවාමි ඥානප්‍රකාසර් ය. (4) ශිවපාදසුන්දරනාර් ය.
(5) අරුණාසල තේසිකර් ය.

**40.** විෂ්ණු දෙවියන්ගේ අනන්ද සයන ස්වරූපය මගින් විශේෂයෙන් ගම්‍යවන දේව ඉතිහාසය වන්නේ,
(1) අවතාර තත්ත්වයයි.
(2) පිළිමය වශයෙන් තිබෙන තත්ත්වයයි.
(3) විෂ්ණු දෙවියන් කිරි මුහුදේ ආදිසෙෂන් නැමැති නාගයා මත සැතපෙන අයුරුයි.
(4) නාගයා මත සිට ආශිර්වාද කරන තත්ත්වයයි.
(5) කලා අලංකරණය පිළිබඳ ප්‍රකාශිත තත්ත්වයයි.

Department of Examinations - Sri Lanka

Past Papers Wiki



- අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශ කියවා, එයට සුදුසු ඒවා පහත වගුවේ සඳහන් **I, II, III, IV** යන තීරුවලින් තෝරන්න.

| I | II | III | IV |
|---|---|---|---|
| A<br>ශෛව ආගම නැවත බිහිකිරීම | F<br>ආත්මීය සභාව ස්ථාපිත කිරීම | K<br>පදිගම් ගැයීම | P<br>වේදාන්තය නැවත බිහිකිරීම |
| B<br>දේවාලවල පුරාණ යුගයේ දසුන් සහිත නෙළීම් | G<br>විරූපාට්සගර් වන්දනාව | L<br>වෛෂ්ණව ආගම පැවතීමට කටයුතු කිරීම | Q<br>පංජාට්ෂර මන්ත්‍රය ප්‍රශංසා කිරීම |
| C<br>ඉන්දියාවේ නවයුගයේ පියා | H<br>දෙවියන් ප්‍රේම මාර්ගයේ වන්දනා කිරීම | M<br>දේවරාජ වන්දනාව | R<br>කාන්තාවන්ගේ අයිතීන් සුරකීම |
| D<br>කත්තියත්තිරයම් | I<br>ජෙයවර්මන් | N<br>සමාජ සමානතාව | S<br>කාලත්ති මහාත්මියම් |
| E<br>විද්‍යාරණ්යර් | J<br>නම්මාල්වාර්ගේ ගීතිකා ජනතාව අතර පැතිරීම | O<br>පසව පුරාණම් | T<br>සංස්කෘත භාෂාව විශේෂත්වයක් ලැබීය |

**41.** තමිල් නාඩුවේ ශෛව භක්ති ව්‍යාපාරයට සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) A, H, K, Q (2) B, F, K, Q (3) B, G, M, T (4) C, E, N, S (5) D, G, N, Q

**42.** නූතන හින්දු ආගමික ප්‍රතිසංස්කාරක රාජාරාම් මොහන්රායි හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) A, G, M, T (2) B, G, M, S (3) C, F, N, R (4) D, H, N, S (5) E, F, O, P

**43.** විජය නගර යුගයේ හින්දු ආගමික පුනර්ජීවනය හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) A, F, M, T (2) B, G, K, S (3) C, I, N, T (4) E, G, O, S (5) E, H, O, T

**44.** කාම්බෝජියාවේ ව්‍යාප්ත වූ හින්දු සංස්කෘතිය හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) A, J, O, R (2) B, I, M, T (3) C, F, M, T (4) D, H, M, S (5) E, H, L, R

**45.** රාමානුජර්ගේ ආගමික සේවා හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) A, G, K, P (2) C, P, M, T (3) D, G, N, T (4) D, J, L, P (5) E, J, K, Q

- අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව කිසියම් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දී ඇත. ඒවායින් මාතෘකාව හා **නොගැළපෙන** කරුණ තෝරන්න.

**46. පැරණි හින්දු අධ්‍යාපන සම්ප්‍රදාය**
(1) ස්වභාවික පරිසරය හා සම්බන්ධ අධ්‍යාපනික ඉගැන්වීම්වලට මුල්තැන දෙන ලදී.
(2) ලෞකික අධ්‍යාපනයට මුල් තැන දෙන ලදී.
(3) අධ්‍යාපනයේ වැදගත් පරමාදර්ශය වූ විනය අවධාරණය කරන ලදී.
(4) කනෙන් කන අසා පවතින අධ්‍යාපන සම්ප්‍රදාය විශේෂත්වයක් ගනී.
(5) ශිෂ්‍යයා ඇඳුරු තුමාගේ නිවසට ගොස් ගුරුකුලයේ වාසය කරමින් අධ්‍යාපනය ලබා ගත්තේ ය.

Department of Examinations - Sri Lanka

**47. හින්දු වෛද්‍ය සම්ප්‍රදාය**

(1) දේවාල සංස්කෘතිය හා සම්බන්ධයි.
(2) සරහර් විසින් ශල්‍යකර්ම තාක්ෂණ හඳුන්වාදෙනු ලැබී ය.
(3) තන්වන්දිරි විසින් ප්‍රභේද කර වැඩි දියුණු කරනු ලැබී ය.
(4) රජවරුන් විසින් වෛද්‍යවරුන්ට සන්නස් ලබා දෙනු ලැබී ය.
(5) අදර්ව වේදයේ විවිධ බෙහෙත් පිළිබඳ අදහස් සඳහන් වී ඇත.

**48. හින්දු දාර්ශනික සම්ප්‍රදායේ බ්‍රහ්මසූත්‍රය**

(1) ප්‍රස්තානතිරයම්හි ඇතුළත් ග්‍රන්ථ තුනෙන් එකකි.
(2) උපනිෂද්වල ඇඳුරුතුමා හා ශිෂ්‍යයන් අතර සිදු වූ දෙබස්වල එකතුවකි.
(3) පාදරායනර් විසින් රචනා කරනු ලැබී ය.
(4) ආත්ම විමුක්තියට මග පෙන්වයි.
(5) පරිච්ඡේද හයකින් සමන්විතයි.

**49. සංග යුගයේ ආගමික මාර්ගය**

(1) සංග යුගය දමිළ ජනයාගේ ආගමික මාර්ගයේ පෞරාණික විශේෂත්වය විදහා දක්වන යුගයක් විය.
(2) සංග යුගයේ පස් වාර්ගික භූමියේ ජීවන ක්‍රමයට අනුව සමාජ පද්ධතිය පැවතී ය.
(3) ජනතාවගේ ජීවිතවලට සංගීතය හා නර්තනය මිශ්‍ර වූ සංස්කෘතියක් පැවතී ය.
(4) ශෛව ආගම ආශ්‍රිත වන්දනා ක්‍රම පැවති බවට සටහන් ඇත.
(5) මෙම කාලයේ වෛෂ්ණව වන්දනාව පැවති බවට සටහන් නොමැති බව විද්වතුන් සලකයි.

**50. පැරණිතම හින්දු නීතිය**

(1) ධර්මය, ව්‍යවහාරම්, සාරිත්තිරම්, රාජසාසනම් යන කරුණු හතර හින්දු නීතිය සඳහා මූලාශ්‍ර වී ඇත.
(2) කාන්තාවන්ගේ අයිතිය පිළිබඳ ඇල්මක් දක්වයි.
(3) රජතුමා කළ වරදට, සාමාන්‍ය ජනයාට වඩා කිහිප ගුණයකින් දඩුවම් පැනවීය.
(4) අධිකරණයේ අගවිනිසුරු වශයෙන් රජතුමා ක්‍රියා කරයි.
(5) 'පරිෂත්' යන නීති සභාව සාමාජිකයන් හත්දෙනාගෙන් සමන්විතයි.

* * *

Department of Examinations - Sri Lanka

PAST PAPERS WIKI

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

46 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. වේද යුගයේ හින්දු ශිෂ්ටාචාරයෙහි විශේෂතා පහත සඳහන් මාතෘකා ඇසුරෙන් පහදන්න.

(අ) වේද ග්‍රන්ථවල ව්‍යුහය

(ආ) ඍග් වේදයේ සඳහන්වන ප්‍රධාන දෙවිවරු

(ඉ) ආගමික වන්දනාව

(ඊ) වේද යුගයේ සමාජය

(ලකුණු 5 × 4 = 20යි)

2. (අ) චෝල යුගයේ දේවාල ගෘහ නිර්මාණ කලාවේ වර්ධනයට දායක වූ චෝල රජවරුන් **තිදෙනෙකුගේ** නම් සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ආ) චෝල යුගයේ දේවාල ගෘහ නිර්මාණ කලාව වර්ධනය වූ ආකාරය පහත සඳහන් මාතෘකා යටතේ පැහැදිලි කරන්න.

(i) ප්‍රාග් යුගයේ චෝල දේවාල (ලකුණු 05යි)

(ii) මධ්‍ය කාලීන චෝල දේවාල (ලකුණු 06යි)

(iii) පසු කාලීන චෝල දේවාල (ලකුණු 06යි)

3. "හින්දු ආගමික සමාජ පුනරුදයේ, රාමක්‍රිෂ්ණ මඩමෙහි දායකත්වය සහ සේවාව සුවිශේෂීය." මෙම ප්‍රකාශයේ යෝග්‍යතාවය පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් විස්තර කරන්න.

(අ) ශ්‍රී රාමක්‍රිෂ්ණර්ගේ දේශනා

(ආ) ස්වාමි විවේකානන්දර් සහ රාමක්‍රිෂ්ණ මඩම

(ඉ) මඩමේ ආගමික සේවා

(ඊ) මඩමේ සමාජ සේවා

(ලකුණු 5 × 4 = 20යි)

Department of Examinations - Sri Lanka

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**4.** සංකරර්ගේ අද්වෛද වේදාන්තයේ ප්‍රධාන අංග සහ ආත්ම විමුක්තියට අදාළ ක්‍රම මාර්ගය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 20යි)

**5.** ශෛව සිද්ධාන්ත දෘෂ්ටි කෝණයේ පදිගේ පැවැත්ම, පදිගේ ගතිලක්ෂණ පිළිබඳ අදහස් විස්තර කරන්න. (ලකුණු 20යි)


**6.** ශ්‍රී ලංකාවේ තිරුකේද්ශ්වරම් දේවාලයේ ප්‍රධාන දෙවියන් (මූර්ති), දේවාල (තල) සහ තීර්තම්හි විශේෂතා පහදන්න. (ලකුණු 20යි)

**7.** මහජනතාවගේ පරිපූර්ණ ජීවිතයට තිරුක්කුරල් ග්‍රන්ථය ලබා දෙන යහපත් උපදෙස් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 20යි)


**8.** ශිව දෙවියන්ගේ නඩරාජ ස්වරූපයේ විශේෂතා එහි ඉරියව්වලින් ප්‍රකාශ කෙරෙන ලාලිත්‍යභාවයන් සහ එම ස්වරූපය විස්තර කරන දාර්ශණික මත ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20යි)

* * *

Department of Examinations - Sri Lanka



වාරෙටම ඕන කරන පොත්
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්
Store
25% OFF
ALL BOOKS
Including Exercise Books,
CR Books, and B5 Books
ම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්
ORDER BOOKS FROM LOL BOOKS STORE


ORDER GCE A/L
SHORT NOTES, MODEL,
REVISION BOOKS & PAST
PAPERS IN SINHALA, ENGLISH
& TAMIL MEDIUM
LOL
BOOK
STORE
CASH ON DELIVERY
AND KOKO PAYMENT
AVAILABLE
WHATSAPP - 0717774440
WEBSITE: WWW.LOL.LK
GET READY FOR YOUR A/Ls